**මුහුදුබඩ පත්තු ප්‍රාදේශීය සභාව**
**මුලතිව් දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුලි 31 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ඔක්තෝබර් 10 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මුහුදුබඩ පත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඉදිරිපත් කිරිමේදී අනුගමනය කළ යුතුව තිබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | සභාව විසින් වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදීත්, ඒවා ඉදිරිපත් කිරීමේදීත් අනුගමනය කළ යුතු පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති නියමිත අයුරින් අනුමත කර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමට සභාවේ ලේකම්වරයා සහ පලාත් පාලන කොමසාරිස්වරයා විසින් කටයුතු කළ යුතුය. | ඉදිරියේදි දෝෂ සිදුනොවන අයුරින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ. |

**(ආ) විගණනය සඳහා සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල එකතුව රු.1,957,685 ක පිරිවැයකින් දක්වා ඇති ඉඩම් කොටස් 40 ක හිමිකම් ඔප්පු, මිනින්දෝරු ප්ලෑන සහ තක්සේරු සහතික යනාදිය පසුගිය වර්ෂ 06 කට අධික කාලයක සිට ඉදිරිපත් | සභාවට අයත් දේපල සම්බන්ධිත ප්‍රාදේශීය ලේකම් කාර්යාල, මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ විධිමත් අදහස් එකඟතාවයන් සහ අනුමැතිය අනුව එමඟින් | අඛණ්ඩව මෙම කටයුතු සිදුකිරීම මඟින් කඩිනමින් සභාවේ නමට අයිතිය මාරු කිරීමට කටයුතු කෙරේ. |

| | |
|---|---|
| කර නොතිබීමෙන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය. | ඉඩම් හිමිකම් ඔප්පු ලබාගෙන මිනින්දෝරු ප්ලෑන මඟින් සාක්ෂි සමඟ අනුමත මිල තක්සේරුකරු හෝ රජයේ තක්සේරුකරුගෙන් ඒවායේ වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන ඒමට සභාවේ ලේකම්වරයා සහ පළාත් පාලන කොමසාරිස්වරයා විසින් කාල ප්‍රමාදයකින් තොරව ක්‍රියාමාර්ග ගත යුතුය. |

**1.4 අනුකූල නොවීම**

**1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) III පරිච්ඡේදය 24 වගන්තිය | සභාවට අයත් මාර්ග සහ මංමාවත්වල ලැයිස්තු පිළියෙල කර රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීමට මේ දක්වා කටයුතු කර තිබුණි. | සභාවේ අනුමැතිය ලබා සහා බල ප්‍රදේශයට අයත් සියළුම මාර්ග සහ මංමාවත්වල ලැයිස්තු පිළියෙල කර රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීමට කටයුතු කළ යුතු වේ. | කඩිනමින් රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීමට කටයුතු කෙරේ. |
| (ii) පරිච්ඡේදය III රීති 33 | වරිපනම් බදු සම්බන්ධයෙන් සමීක්ෂණයක් පැවැත්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වරිපනම් බදු තක්සේරු කිරීම් කඩිනමින් සිදුකර වරිපනම් බදු ගණනය කර වාර්ෂිකව වරිපනම් බදු සෑම කාර්තුවකම සහා බල ප්‍රදේශයට අයත් දේපලවලින් අයකිරීමට විසින් ක්‍රියාමාර්ග ගත යුතු වේ. | පසුගිය කාලයේ පැවති අයහපත් වාතාවරණය නිසා දේපල බදු සම්බන්ධයෙන් වන ලේඛන විනාශ වීම් ඒ සම්බන්ධ තක්සේරු කිරිම් පසුගිය වර්ෂයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් සිදු කරන ලදී. මේ පිළිබඳ තොරතුරු සොයාගෙන පසුගිය වර්ෂයේදී තක්සේරු දෙපාර්තමේන්තුවට යවන ලදී. මෙහි ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙස ලිපි දෙකක් |

| | | | | |
|---|---|---|---|---|
| | | | | මගින් දැනුම් දී තිබුණත් මේ දක්වා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කටයුතු සිදුකර නොතිබුණි. ග්‍රාමසේවක කොට්ඨාශ 14 ක් වරිපනම් බදු තක්සේරු කිරීම සඳහා සංවර්ධිත ප්‍රදේශ ලෙස 2018.12.28 දිනැති රජයේ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කර ඇත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 571 | කල් ඉකුත් වූ ඇප මුදල් තැන්පතු 10 ක් සහ ආපසු ගෙවිය යුතු ලංසු ඇපකර තැන්පතු 03ක එකතුව රු. 312,198ක් සම්බන්ධයෙන් ඵලදායී ක්‍රියාමාර්ග නොගෙන වර්ෂ 01 සිට වර්ෂ 10 ක් තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි. | කාලය ඉක්ම වූ තත්ත්වයේ පැවති මෙවැනි තැන්පතු අදාප පාර්ශවයන්ට ආපසු නොගෙවීමට හේතු සභාව විසින් විධිමත්ව පරිශීලනය කර ආපසු ගෙවීමට හෝ නිරවුල් කිරීමට හෝ නැතහොත් විධිමත් අනුමැතීන් සහිතව රජයේ ආදායමට මාරු කිරිමට කටයුතු කළ යුතුය. | අදාල පරිදි ඉදිරි ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ii) | මුදල් රෙගුලාසි 770 සහ 771 | සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව ප්‍රකාරව සිදු කළ යුතුව තිබූ පසු විපරම් කටයුතු සිදු කර නොතිබුණි. | පසු විපරම් කටයුතු එම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කිරීමට ප්‍රථම සිදුකර අවසන් කිරීමට ක්‍රියාකළ යුතු වේ. | අනාවරණය කරනු ලැබූ නිරීක්ෂණයන් සැලකිල්ලට ගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| | ප්‍රසම්පාදන අත්පොතේ 5.4.12 මාර්ගෝපදේශය | එකතු කළ අගය මත බදු මුදල් ගෙවූ පසු එහි තොරතුරු ඊලඟ මාසයේ 15 දිනට පෙර දේශීය ආදායම් | සඳහන් කර ඇති ප්‍රසම්පාදන අත්පොතේ 5.4.12 මාර්ගෝපදේශය ප්‍රකාරව කිසියම් | ප්‍රවර්තන වර්ෂයේ සිට එකතු කළ අගය මත බදු පිළිබඳ බදු ලැයිස්තු මාසිකව යැවීමට කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | කොමසාරිස්වරයාටත් එහි පිටපතක් විගණකාධිපතිවරයාටත් යවා නොතිබුණි. | මාසයක ගෙවන ලද එකතු කළ අගය මත බදු තොරතුරු වහාම ඊලඟ මාසයේ 15 දිනට පෙර ඉදිරිපත් කිරීමට ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම අත්‍යාවශ්‍ය වේ. | |
| (ඇ) රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය | සභාවේ වාහන 20 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ ඉන්ධන පරිභෝජන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | සභාවේ භාවිතයේ ඇති සියළුම වාහන සඳහාත් ඉන්ධන පරිභෝජනය විධායක මට්ටමේ නිළධාරියෙකු ඉදිරියේ අවම වශයෙන් වර්ෂයකට වරක් හෝ ඉන්ධන පරිභෝජනය පිළිබඳ පරීක්ෂාවක් සිදුකර තහවුරු කර වාහන දෛනික ධාවන සටහන් මගින් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුවේ. | සභාව සතු වාහන 35කින් ට්‍රේලර් 16ක් සඳහා ඉන්ධන දහනය පරීක්ෂාව සිදු කිරීම අවශ්‍ය නොවේ. ඉතිරි වාහන 19න් ට්‍රැක්ටරයක් අතුරුදහන්ව ඇති අතර වාහන 09ක් සඳහා ඉන්ධන දහනය පරීක්ෂාව සිදුකර ඇත. අනෙකුත් වාහන අලුත්වැඩියා කටයතු සිදු කිරීම, ලියාපදිංචි කිරීමේ පොත් ලබා ගෙන නොතිබීම වැනි හේතු නිසා ඉන්ධන දහනය විමේ පරිකෂාවන් සිදු කර නොතිබුණි. |

## 2 මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 25,295,430 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 38,110,537 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

-------------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

-------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල්කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල්කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 442,500 | 441,223 | 441,223 | – | 421,500 | 392,910 | 392,910 | – |
| (ii) | කුලී | 17,402,500 | 16,761,854 | 16,761,854 | – | 17,098,600 | 16,186,770 | 16,186,770 | – |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,541,400 | 2,328,704 | 2,328,704 | – | 1,420,600 | 1,617,369 | 1,617,369 | – |
| (iv) | වෙනත් ආදායම් | 23,860,040 | 28,752,963 | 28,752,963 | 23,518,828 | 19,581,290 | 32,703,888 | 14,897,344 | 17,806,544 |
| | එකතුව | 43,246,440 | 48,284,744 | 48,284,744 | 23,518,828 | 38,521,990 | 50,900,937 | 33,094,393 | 17,806,544 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උතුරු පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් පසුගිය වර්ෂය සඳහා ලැබිය යුතුව තිබූ උසාවි දඩ මුදල් එකතුව රු.15,617,241කින් රු.10,956,808ක් හෙවත් සියයට 70ක් වර්ෂයට අධික කාලයක සිට නියමිත පදිරි අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | සභාවට අයත් උසාවි දඩ මුදල් ප්‍රමාද හිමිකම් පෑමෙන් අනතුරුව වර්ෂයක් ඇතුළත ප්‍රධාන ලේකම්වරයාගේ ඉල්ලීම් කිරීමෙන් ලබාගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. | 2019 අප්‍රේල් 18 දින එකතුව රු. 10,956,808.21ක් ලැබී ඇත. |

### 2.2.3 බලපත්‍ර ගාස්තු

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ නියමයන් ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ ඉදිකර තිබූ විදුලි සංදේශ කුළුණු 11 ක් සම්බන්ධයෙන් සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම, මූලික සැලසුම් අනුමත කිරීම, අනුකූලතා සහතික නිකුත් කිරීම සහ ආවරණ අනුමැතිය ලබාදීම යන සතර ආකාරයේ ගාස්තු සම්පූර්ණයෙන්ම අයකර නොතිබූ බව නිරීක්ෂණය වූ අතර ගාස්තුවල එකතු වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙනැවිත් නොතිබුණි. | සියළුම විදුලි සංදේශ කුළුණු සම්බන්ධයෙන් මෙවැනි වර්ග 04 ක ගාස්තුත් නියමිත පරිදි වාර්ෂිකව තක්සේරු කර සභාවේ ආදායම් ගිණුමට ගෙන ඒමට කටයුතු කළ යුතු වේ. | අදාල විදුලි සංදේශ කුළුණු ප්‍රධාන කාර්යාල සමඟ සාකච්ඡා කොට අදාළ ගාස්තු ප්‍රවර්තන වර්ෂයේ අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

| | | |
|---|---|---|
| (ආ) මුල්ලියවලෙයි උප කාර්යාලයේ වර්ග 20 ක එකතුවක් වූ ව්‍යාපාරික ආයතන 162 ක් සමාලෝචිත වර්ෂය සඳහා ස්ථිර බලපත්‍ර ගාස්තු හෝ බදු සහතික ලබා නොගෙන ව්‍යාපාර කටයුතුවල නිරත වී තිබූ බව නිරීක්ෂණය විය. එවැනි ගාස්තුවල එකතුව ගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. | ස්ථිර ව්‍යාපාර බලපත්‍ර, බදු සහතික ලබා නොගෙන ක්‍රියාත්මක වන ව්‍යාපාරික ආයතන හඳුනාගෙන කටයුතු කළ යුතු අතර, අදාළ වර්ෂයක් සඳහා ව්‍යාපාර බදු ගණනය කර නියමිත කාලයේ නිසි අයුරින් සභාවේ ආදායම් ගිණුම්වලට ඇතුළත් කිරීමට වාර්ෂිකව සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. | මුල්ලියවලෙයි උප කාර්යාල බල ප්‍රදේශයට අයත් ව්‍යාපාරික ආයතනවලින් 2018 වර්ෂය සඳහා ව්‍යාපාර බලපත්‍ර ගාස්තු අය කර ගෙන ඇත. |

**2.2.4** **උසාවි දඩ මුදල් මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට රු.20,199,358ක උසාවි දඩ මුදල් සහ රු. 3,319,470ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි. | සභාවට අයත් උසාවි දඩ මුදල් ඒවා හිමිකම් පෑමෙන් අනතුරුව වර්ෂයක් ඇතුළත ප්‍රධාන ලේකම්වරයාගේ ඉල්ලීම් කිරීමෙන් ලබාගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. | 2018 දෙසැම්බර් 31 දිනට හිඟ මුදලින් උසාවි දඩ මුදලින් රු.10,956,808.21ක් ලබාගෙන ඇති අතර මුද්දර ගාස්තු හිඟ රු.3,133,485ක් ලබා ගෙන ඇත. ඉතිරි මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** **අපේක්ෂා කළ ප්‍රතිඵල අත්කර කරගැනීමට අපොහොසත් වීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් මාර්ග 05 ක් ප්‍රතිසංස්කරණ කාර්යයන්වල කාර්යසාධනය සඳහා සමාලෝචිත වර්ෂයේ රු.14,777,577 ක් සුළු ණය | අදාළ මූල්‍ය වර්ෂයේ අවසන් වූ කාර්යයන්ගේ ප්‍රමාණයට අනුව වටිනාකම් ගණනය කර මූලධන වියදම් ලෙස දැක්විය යුතු අතර එහි සැපයුම්කරුවන්ට ගෙවිය යුතු | ගෙවීම් ලේඛන ඉදිරිපත් කර ඇත. කාර්යයන් අවසන් අදියරෙහි පවතී. |

| | | |
|---|---|---|
| හිමියෝ ගිණුමට බැර කර වියදම් ලෙස දක්වා තිබුණත් අපේක්ෂා කළ මට්ටමේ ප්‍රතිඵල ළඟා කරගැනීමේ ක්‍රියාමාර්ග ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | තහවුරු කළ ගෙවීම්වල වටිනාකම පමණක් සුළු ණයහිමි ගිණුමට ගිණුම්ගත කළ යුතුය. කෙසේ වෙතත්, අදාළ ව්‍යාපෘති නියමිත කාලයේ අවසන් කර ඒවායේ ප්‍රයෝජන මහජනතාවට ලබාදීමට සභාව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. | |

**(ආ) අපේක්ෂා කළ ප්‍රතිලාභ (outcome) අත්පත් කරගැනීමට අපොහොසත් වීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම් 02 ක් සඳහා රු.1,057,160 ක් වැය කර අපේක්ෂා කළ ප්‍රතිලාභ (outcome) ළඟා කරගෙන තිබුණද, එමඟින් ළමා විනෝදාස්වාදය සහ අලෙවිකරණය වැනි අපේක්ෂා කළ ප්‍රතිඵල පසුගිය වර්ෂ 03 සිට 04 ක් දක්වා ළඟා කරගෙන නොතිබුණි. | මහජනතාව/ මහජනතාව අනුමත කළ නියෝජිතයන්ගේ අදහස් දැක්වීම්, ව්‍යාපෘති සිදුකරන ස්ථානය පිළිබඳව ශක්‍යතා අධ්‍යයනය (Feasibility study Analysis) ක්‍රියාත්මක නොකර සිදුකළ මෙම ව්‍යාපෘති වලට සම්බන්ධ අය හඳුනාගෙන විමර්ශනයන් සිදුකර අදාළ වැය කර තිබූ රු.මිලියන 1.06 ක මුදල් නාස්තිය සඳහා හේතු විමසීමට හෝ නියමිත පරිදි ක්‍රියාත්මක කිරීමට හෝ මුදල් නාස්තිය නියමිත පරිදි අයකරගැනීමට සභාව/ පළාත් පාලන කොමසාරිස්වරයා/ ප්‍රධාන ලේකම් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. | මුල්ලියවලෙයි අයියනගර් පදිංචි ස්ථානයේ සති පොළ ව්‍යාපෘතිය ආරම්භ කර අවසන් අදියරේදී මාංජෝලෙයි රෝහලට ඉදිරියෙන් නීති විරෝධී ලෙස ජනතාව විසින් සති පොළ ආරම්භ කර තිබුණි. මෙය වලක්වාලීමට සභාව විසින් නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබුණත් වැලැක්වීමට නොහැකි වී තිබුණි. තවද, නෙල්සිප් ව්‍යාපෘතිය මඟින් ඉදිකර ආරම්භ කරනු ලැබූ උන්නාප්පිලවු ළමා උද්‍යානය ප්‍රසිද්ධියට පත් වී නොතිබුණි. ඉදිරියේදී මෙයින් ආදායම් ඉපැයීමේ ව්‍යාපාරික ආයතනය ඉදිකර ආදායම් ලබාගැනීමට හැකි ආයතනයක් බවට පත්කිරීමට සැලසුම් කර ඇත. |

**(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ සිට බැහැර කරන කසළ කොම්පෝස්ට් සහ ප්‍රතිචක්‍රියකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා එකතුව රු.5,027,617 ක වටිනාකමින් ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු අවසන් කර සභාවට භාර දී තිබුණද, මෙහි මෙහෙයුම් | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සමඟ සම්බන්ධ මෙම ක්‍රියාකාරකම් මෙම ගොඩනැගිලි ඉදිකිරීම් කාර්යයේ අරමුණු හා සම්බන්ධීකරණය කර ප්‍රයෝජනවත් අයුරින් | මුල්ලියවායික්කාල් ඝන අපද්‍රව්‍ය පොහොර බවට පත්කිරීමේ මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමේ ව්‍යාපෘති අවසන් කර දැනට වෙන්කිරීම් සහ ඒවා පොහොර බවට පත්කිරීමේ මුල් අදියරේ කාර්යයන් සිදු කරමින් පවතී. |

| | | |
|---|---|---|
| කටයුතු කාර්යක්ෂම ආකාරයෙන් මේ දක්වා ආරම්භ කර නොතිබුණි. | ක්‍රියාත්මක කිරීමට සභාව විසින් වහාම සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. | |

**(ඇ) තිරසාර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2030 වර්ෂයේ තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සභාව විසින් ළඟා කර ගත යුතු ඉලක්ක සහ එම ඉලක්ක ළඟාකර ගැනීමේදි පවතින දුෂ්කරතාවයන් මෙන්ම ඉදිරි ක්‍රියාකාරකම් මැනීම සඳහා දර්ශකයන්ද 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ ප්‍රකාරව සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අනුමැතිය සහිතව ඉදිරියට කරගෙන යාම සඳහා වූ ලේඛන යවා ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පසුගිය වර්ෂවලත් සමාලෝචිත වර්ෂයේදීත් පරිත්‍යාග ලෙස ලැබී තිබූ පුස්තකාල පොත් 189 ක එකතු වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ගෙන ඒමට කටයුතු කර නොතිබුණි. | සභාවට පරිත්‍යාග ලෙස ලැබී භාවිතා කරනු ලබන සියළුම ලී බඩු හා කාර්යාල උපකරණවල වටිනාකම සභාවේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු වේ. | ප්‍රවර්තන වර්ෂයේ තක්සේරු කමිටුවක් ස්ථාපිත කර මිල ගණන් තීරණය කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | සභාවට පරිත්‍යාග ලෙස ලැබී තිබූ හා මිලදී ගෙන තිබූ ලී බඩු හා කාර්යාල උපකරණ 297 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | සභාවට පරිත්‍යාග ලෙස ලැබී භාවිතා කරනු ලබන සියළුම ලී බඩු හා කාර්යාල උපකරණවල වටිනාකම සභාවේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු වේ. | තක්සේරු කමිටුවක් ස්ථාපිත කර පිරිවැය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු ලැබේ. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

### (අ) තනතුරු පුරප්පාඩු

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභාවට අදාළ තනතුරු පුරප්පාඩු 15 ක් පුරවා නොතිබීම නිසා ක්‍රියාත්මක කර ඇති සභාවේ කාර්යයන්, සංවර්ධන වැඩසටහන් අවසන් කිරීමේ දී ප්‍රමාදවීම් සිදු වී තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. | සභාවේ දෛනික කටයුතු සහ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමටත් අනුමත කළ සේවක මණ්ඩලය ලබා ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස්/ ප්‍රධාන ලේකම්වරයා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. | අපගේ අංක NP/14/44(I)/1/1//E1 /Cadre/ 2018-01 දරන 2018 සැප්තැම්බර් 19 දිනැති ලිපිය මඟින් ආදායම් පරීක්ෂක පුරප්පාඩු සඳහා ඉල්ලීම් ලිපි පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාට යවා ඇත. |
| (ii) | සභාව කාර්යාල සේවකයන් යොදා ගනිමින් ආදායම් පරීක්ෂක සහ වෙළඳපොල සුපරීක්ෂවරුන්ගේ කාර්යයන් ඉටු කරවා ගැනීම නිසා සභාවේ කාර්යක්ෂම ආදායම් රැස්කිරීම්, සතුටුදායක කාර්යාල කාර්ය සේවාවන් ආදියට බාධා සිදු වී තිබුණි. සේවක තනතුරු පුරප්පාඩු පුරවා සභාව කාර්යක්ෂම ආකාරයෙන් මෙහෙයවීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බව ද නිරීක්ෂණය විය. | අනුමත කළ සේවක මණ්ඩලය ලබා ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස්/ ප්‍රධාන ලේකම්වරයා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. | ලැයිස්තුගත නොකළ තනතුරු පුරප්පාඩු සඳහා ඉල්ලීම් කිරීමේ ලිපිය පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා මාර්ගයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවට යවා ඇත. |

### (ආ) සේවක ණය

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සේවයෙන් ඉවත් වූ, මියගිය සහ ස්ථාන මාරුවීම් ලබාගිය සේවකයන් 07 දෙනෙකුගේ හිඟ සේවක ණය එකතුව රු.658,278 ක් පසුගිය වර්ෂ 10 ක් පුරා අයකර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග සහ ආයතන සංග්‍රහයේ XXV පරිශිෂ්ඨයේ 4 වගන්තිය ප්‍රකාරව කටයුතු නොකර | (i) කපා හැරිය යුතු බවට සභාව විසින් අදහස් කරන හිඟ සේවක ණය මුදල් සම්බන්ධයෙන් සියලුම සේවක ණය පරිශීලනය කර විධිමත් පරිදි තහවුරු කරගැනීමෙන් පසුව අනුමැතියන් සහිතව කපා හැරීමට කටයුතු කළ යුතු වේ.<br>(ii) ගෙවීම්, දෙපාර්තමේන්තුවේ ගෙවීම් සිදුකළ බවට නිවැරදි ලේඛන ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙන් | ප්‍රවර්තන වර්ෂයේ නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | අඛණ්ඩව හිඟ හිටව පැවතුණි. | ලබා තහවුරු කර නිවැරදි කිරිමට කටයුතු කළ යුතු වේ.<br><br>(iii) ගැලපීම් කළ යුතු තත්ත්වයේ පවතින බවට දැනුවත් කර ඇති සේවකයන් තිදෙනෙකුගේ සේවක ණය හිඟ මුදල් ආයතන සංග්‍රහයේ XXV පරිශිෂ්ඨයේ 4 වගන්තියේ 4.2.4 උපවගන්තිය ප්‍රකාරව ගැලපීමට සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. | |
| (ii) | වෙනත් කාර්යාලවලට ස්ථාන මාරු වීම් ලබාගිය සේවකයන් තිදෙනෙකුගේ හිඟ ආපදා ණය එකතුව රු.264,129 ක් පසුගිය වර්ෂ 03 සිට වර්ෂ 04 ක් පුරා අය කරගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ස්ථාන මාරුවීම් ලබාගිය දෙපාර්තමේන්තු මාර්ගයෙන් අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතු වේ. | ප්‍රවර්තන වර්ෂයේ නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (iii) | සේවකයින් 04 දෙනෙකුගේ එකතුව රු.194,446 ක් වටිනා සේවක ණය මාසික වාරික මුදල් වර්ෂ 01 සිට 02 දක්වා අය කරගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ දක්වා අයකරගෙන නොමැති සේවකයන් තිදෙනෙකුට ලබා දී ඇති සේවක ණය හිඟ මුදල් නියමිත පරිදි අයකර ගැනීම සඳහා සභාව විසින් කටයුතු කළ යුතු වේ. | ප්‍රවර්තන වර්ෂයේ නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. |

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම**

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් වාහන 15ක් තක්සේරු කර පසුගිය වර්ෂ 01 සිට 02 දක්වා මූල්‍ය ප්‍රකාශනවලට ගෙන ඒමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සභාවට අයත් වාහන 15ක වටිනාකම තක්සේරුකරුවකු හෝ අනුමත තක්සේරුකරුවකු විසින් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන ඒමට කටයුතු කළ යුතුය. | සභාවට අයත් වාහන 15 ක වටිනාකම යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු මාර්ගයෙන් වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. |

**3.4.2 පවරා නොගත් වත්කම්**

| | විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රජය සහ රජයේ නොවන ආයතනවලින් ලබාදි සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන වාහන 10 ක් සඳහා වාහන ලියාලදිංචි කිරීමේ පොත් ලබාගැනීමට පසුගිය වර්ෂ 07 ක් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | සභාව විසින් නියමිත පරිදි ලියාපදිංචි කළ පොත් ලබා ගෙන සභාව සතුව පවතින වාහන භාවිතා කිරීම සඳහා කටයුතු කළ යුතු වේ. | ප්‍රවර්තන වර්ෂයේ ලියාපදිංචි පොත් නොමැති වාහන සඳහා ලියාපදිංචි කිරීමේ පොත් ලබාගැනීමට ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (ආ) | රජය සහ රජයේ නොවන ආයතනවලින් ලබාදි තිබූ වාහන 05ක අයිතිය සභාවට මාරු කර නොගෙන පසුගිය වර්ෂ 01 සිට වර්ෂ 06ක් දක්වා සභාව විසින් ප්‍රයෝජනයට භාවිතා කර තිබුණි. | (i) 2013 වර්ෂයේ අතුරුදහන් වූ වාහනය සම්බන්ධයෙන් අදාළ විමර්ශනයන් සිදුකර මුදල් රෙගුලාසි 103 සහ 104 ප්‍රකාරව ක්‍රියාමාර්ග වහාම ගත යුතු වේ.<br>(ii) අනෙකුත් වාහන 04 සම්බන්ධයෙන් පරිත්‍යාග වශයෙන් ලද වාහන සභාවට පවරා ගැනීම සඳහා කටයුතු සිදු කළ යුතු වේ. | වාහනවල අයිතිය මාරු කර ගැනීම සඳහා ආදායම් බලපත්‍ර ලබාගැනීමට ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

**3.4.3 නිෂ්ක්‍රිය / ඌන උපයෝජිත වත්කම්**

| | විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවට පරිත්‍යාග කර තිබූ වාහන 04 ක් පසුගිය වර්ෂ 03 ක සිට භාවිතා නොකර ගබඩාවේ තිබුණි. | (i) වාහන ලියාපදිංචි කිරීමේ පොත් ලබාගෙන ප්‍රයෝජනවත් ආකාරයෙන් භාවිතා කිරීමට සභාව විසින් කටයුතු කළ යුතු වේ.<br>(ii) අලුත්වැඩියා කළ යුතු වාහනය අලුත්වැඩියා කර භාවිතා කිරීමට සභාව විසින් කටයුතු කළ යුතු වේ.<br>(iii) අනෙකුත් වාහන දෙක සඳහා ආදායම් බලපත්‍ර ලබාගෙන භාවිතා කිරීමට සභාව විසින් කටයුතු කළ යුතු වේ. | මේවාට ආදායම් බලපත්‍ර ලබාගැනීමට කටයුතු කර ඇත. |
| (ආ) | සභාව විසින් භාවිතා නොකළ පරිගණක සහ ඡායා පිටපත් යන්ත්‍ර | දැනට ලැබී ඇති ගැලපෙන ඡායා පිටපත් යන්ත්‍ර පිළිබඳ විස්තර විගණනයට දැනුවත් කළ යුතු අතර | භාවිතා කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. |

| | | |
|---|---|---|
| එකතුව රු.137,200 ක් වටිනා ටෝනර් මිලදී ගෙන පසුගිය වර්ෂ දෙකක සිට භාවිතයකින් තොරව ගබඩාවේ තබා තිබුණි. | එවැනි ටෝනර් කල් ඉකුත් නොවූ කාලය ඇතුළත පවතී ද යන්න පරීක්ෂා කර භාවිතා කිරීමට කටයුතු කළ යුතු වේ. එසේ නැතහොත් එයට ගැලපෙන යන්ත්‍ර සභාවට නොලැබී ඇති අවස්ථාවක ඒවා මිලදී ගැනීමට හේතු විමසා සම්බන්ධිත නිලධාරී/රීන්ගෙන් එම මූල්‍යමය පාඩුව අයකිරීම සඳහා කටයුතු කළ යුතු වේ. | |

### 3.4.4 වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණය

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව සභාවේ මුලතිව්, මුල්ලියවායික්කාල් සහ සෙම්මලෙයි උප කාර්යාල වල පුස්තකාල පොත් 67 ක ඌනතාවයක් තිබූ බව නිරීක්ෂණය විය. | ඌනතාවය සඳහා හේතු විමසා සම්බන්ධ පුස්තකාලයාධිපති/ අදාළ අයගෙන් අයකර ගැනීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගත යුතු වේ. | වාර්ෂික සමීක්ෂණයේදී උප කාර්යාල වල අඩු වී පැවති පොත් දැනට ගැලපීමට ඉදිරි ක්‍රියාමාර්ග ගෙන ඇත. |

### 3.4.5 වත්කම්වල ආරක්ෂාව තහවුරු කිරීම

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උතුරු පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් විධිමත් අනුමැතිය රහිතව සභාවේ අංක NPLL 7767 දරන කැබ් රථය යාපනය දිස්ත්‍රික්කයට ගමන් කිරීමේදී 2019 ජුලි 25 අනතුරට පත් වී තිබීම පිළිබඳ හේතු, පාඩුවේ ප්‍රමාණය, වගකිව යුතු අය පිළිබඳ විස්තර තීරණය කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව සිදුකළ යුතු ක්‍රියාමාර්ග මේ දක්වා ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි 103 සහ 104 අනුව විමර්ශනයන් සිදුකර සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට වහාම කටයුතු කළ යුතු වේ. | වාහනයේ ගමන් කළ නිලධාරීන්ගෙන් අනතුර පිළිබඳ වාර්තා ලබාගෙන ඇති අතර පොලිසියේ විමර්ශනයන්ද සිදු වී තිබුණි. ඉදිරියේදී ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් අභ්‍යන්තර විමර්ශන කමිටු ස්ථාපිත කර අනතුරු සිදුවන අවස්ථාවේදී විමර්ශනයන් සිදු කෙරේ. |

## 3.5 ආර්ථික නොවූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණ | | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ එකතුව රු.364,653 ක් වටිනා වර්ග 05 ක කාර්යාල අවශ්‍යතා භාණ්ඩ නියමිත අයුරින් සැලසුම් කර මිලදී ගෙන නොතිබූ බැවින් අනාර්ථික ප්‍රමාණයන්ගෙන් ලැබී ගබඩාවේ තබා තිබුණි. | (i) | සභාවට අවශ්‍ය භාණ්ඩවල අවශ්‍යතාවයන් සේවකයින්ගෙන් ඉල්ලා ලබාගෙන එයට අනුව මිලදී ගැනීමේ සැලසුම් සකස් කර ප්‍රසම්පාදන සැලැස්මට අනුව භාණ්ඩ මිලදී ගැනීමට සභාව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී මේවා පිළිබඳ අවධානය යොමු කර නිවැරදි කිරීමට සැලසුම් කර ඇත. |
| | (ii) | භාවිත කාලය ඉකුත් වීමට ප්‍රථම කාර්යාල අවශ්‍යතා අයිතමයන් ප්‍රයෝජනවත් ආකාරයෙන් යොදාගැනීමට සභාව විසින් ක්‍රියා කළ යුතු වේ. | ඉදිරියේදී මේවා පිළිබඳ අවධානය යොමුකර නිවැරදි කිරීමට සැලසුම් කර ඇත. |

## 3.6 ප්‍රසම්පාදනය

### 3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂයේ සභාවට අදාළ ප්‍රසම්පාදන සැලැස්ම සහ ප්‍රසම්පාදන කාලසටහන පිළියෙල කර නොතිබුණි. | සභාව විසින් කඩිනමින් ඊළඟ වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම හා ප්‍රසම්පාදන කාලසටහන පිළියෙල කර අනුමත කරගෙන ඒ අනුව කටයුතු කළ යුතු වේ. | සභාව විසින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියක්, මිලදී ගැනීමේ කටයුතු සඳහාත් ඉදිරියේදී ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

### 3.6.2 භාණ්ඩ හා සේවාවන්

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ එකතුව රු.462,000 කට මිලදී ගෙන තිබූ ඉලෙක්ට්‍රෝනික උපකරණ 10 ක් 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7 පරිච්ඡේදයේ 7.11 | තාක්ෂණික ඇගයීම් කමිටු විවිධ වර්ගයේ එක් එක් භාණ්ඩය සඳහා වෙන වෙනම ස්ථාපිත කර එමගින් ඇගයීම් කිරීමෙන් | ප්‍රවර්තන වර්ෂයේ මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු පරීක්ෂා කර නිර්දේශ සමඟ ක්‍රියාත්මක කරනු ලැබේ. |

| | | |
|---|---|---|
| මාර්ගෝපදේශය ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පරීක්ෂාවට භාජනය කර නොතිබුණි. | අනතුරුව ප්‍රසම්පාදන කමිටු විසින් තීරණය කළ පරිදි මිලදී ගැනීම් සිදු කළ යුතු වේ. | |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තු කර තිබූ වැඩසටහන්වලින් එකතුව රු.21,500,000ක් වටිනා මූලධන වැඩසටහන් 06 ක් ක්‍රියාත්මක නොකර අත්හැර දමා තිබුණි. | සභාවේ වාර්ෂික අයවැය සැලැස්ම සුදුසු පරිදි ප්‍රයෝජනවත් ආකාරයට පිළියෙල කර මහජන අදහස් දැනගැනීම පිණිස ප්‍රදර්ශනය කර සභාව විසින් අනුමත කර, පිළියෙල කර ඒ අනුව වාර්ෂික ක්‍රියාකාරකම් සභාව විසින් ක්‍රියාත්මක කර නියමිත කාලයේ සුදුසු අයුරින් ඉටුකිරීමට කටයුතු කළ යුතු වේ. ප්‍රවර්තන වර්ෂයේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර ක්‍රියාත්මක කරනු ලැබේ. | ප්‍රවර්තන වර්ෂයේත් ඉදිරි කාලවලත් අයවැය සකස් කිරීමේදී නිවැරදි පරිපාටි අනුගමනය කර සභා තීරණයන්ට අනුකූලව පිළියෙල කෙරේ. |

### 4.2 අභ්‍යන්තර පාලනය

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ කටයුතු පරීක්ෂා කර කාර්යක්ෂමව ක්‍රියාකාරකම් කරගෙන යාම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා විගණන වැඩසටහන සහ අභ්‍යන්තර විගණන වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 134(2) ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ප්‍රවර්තන වර්ෂයේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර ක්‍රියාත්මක කරනු ලැබේ. |